# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ද.මු. දසනායක සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ)

**ද.මු. දසනායක සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වික්ටර් ඇන්ටනී මහතා විසින්
2011 මැයි මස 04 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2011 අප්‍රේල් මස 11 වැනි දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[105 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 යි තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

2—PL 006025—750(2011/05)

## ද.මු. දසනායක සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ)

### ද. මු. දසනායක සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

*පූර්විකාව.*

"ද. මු. දසනායක සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වී ඇති රීතිවලට අනුකූලව එකී පදනම සම්බන්ධ සියලු කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, එකී පරමාර්ථ සහ කරුණු එකී පදනම විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය.*

**1.** මේ පනත 2011 අංක දරන "ද.මු. දසනායක සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම" (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ද.මු. දසනායක සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම සංස්ථාගත කිරීම.*

**2.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) ද.මු. දසනායක සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනමේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරගනු ලබන සියලු තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ද.මු. දසනායක සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

*සංස්ථාවේ පොදු පරමාර්ථ.*

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ශ්‍රී ලාංකික ජනතාවගේ දිළිඳුබව පිටුදැකීම උදෙසා අවශ්‍ය සංවර්ධනය තුළින් ජනතාව පෝෂණය කිරීම;

(ආ) මානව වර්ගයා මුහුණ දෙන මානසික හා චිත්තවේග පීඩාවන්ට සහනදායි ඉගැන්වීම ප්‍රගුණ කිරීමෙන් ඔවුන් තුළ පවතින අසහනකාරී තත්ත්වය අවම කොට සහනශීලී දිවි පෙවෙතකට යොමු කරවීම ;

(ඇ) බාල, තරුණ, මහලු කවර වයස් මට්ටමක අයකුට වුව ද බුදුදහම තුළින් ලැබෙන ජීවිත පරිඥානය අවබෝධ කොට ගෙන මානව සමාජයේ පුළුල් නියෝජනයක් ඇතිවන ආකාරයට සහයෝගය හා සහජීවනය වර්ධනය කොට පටු වාද භේදවලින් ශ්‍රී ලාංකික ජනතාව මුදවා ගැනීම ;

(ඈ) ජාති, ආගම් භේදවලින් තොර වූ සදාචාරාත්මක සමාජයකට ඉවහල් වන සමාජ පෞරුෂත්වය හඳුනාගෙන පවුල හා සමාජය ස්වයංපෝෂිත ඒකකයක් බවට පත් කිරීම ;

(ඉ) දරිද්‍රතාවෙන් පෙළෙන දූ දරුවන්ගේ කායික හා මානසික සංවර්ධනය සඳහා මූල්‍යමය හා භෞතික ප්‍රතිපාදන ලබා දෙමින් ඔවුන්ගේ පෞරුෂ සංවර්ධනය සඳහා උපරිම දායකත්වය සැලසීම ;

(ඊ) කෘෂිකාර්මික හා ආර්ථික මුලෝපායයන් ඵලදායී ලෙස පවත්වාගෙන යාම සඳහා අධ්‍යයන න්‍යායික හා ප්‍රායෝගික දැනුම අවශ්‍ය පිරිස් වෙත ලබා දීම ;

(උ) පාසල් අධ්‍යාපනය ලබන දූ දරුවන්ගේ සාක්ෂරතාවය වර්ධනය කරමින් ඔවුන් ඉදිරිපත් වන ප්‍රසිද්ධ විභාග සඳහා ශ්‍රී ලාංකික විද්වතුන්ගේ මගපෙන්වීම හා අමතර උදව් ලබා දීම සඳහා එකී දරුවන් යොමු කිරීමට අවශ්‍ය භෞතික හා මානව සම්පත් ප්‍රවර්ධනය කිරීම ;

(ඌ) ස්වයංරැකියා ජීවනෝපායයන් සඳහා උනන්දුවක් දක්වන තරුණ තරුණියන්ට ඒ සඳහා අවශ්‍ය වෘත්තීය පුහුණුව, භෞතික හා මූල්‍ය සම්පත් සපයා දෙමින් පවුල තුළ යහපත් ආර්ථික රටාවක් ගොඩනැගීමට ආධාර කිරීම ;

(එ) උක්ත පදනමේ අරමුණු හා පරමාර්ථ සමග සැසඳෙන දේශීය හා විදේශීය වෙනත් ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම හා අවශ්‍ය වන විට සම්පත් හුවමාරු කර ගැනීම හා එම ආයතන සමග ඒකාබද්ධව කටයුතු කිරීම;

(ඡ) පදනමේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය පොත්පත්, වාරසඟරා, අත්පත්‍රිකා, ප්‍රවෘත්ති පත්‍ර, සඟරා මුද්‍රණය කොට ප්‍රකාශයට පත් කිරීම හා අවශ්‍යතාව පරිදි බෙදාහැරීම ;

(ඣ) පරිපූර්ණ ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය කායික, මානසික, සාමාජයීය, සදාචාර හා බුද්ධි සංවර්ධන කටයුතු උදෙසා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැරව සම්මේලන, සම්මන්ත්‍රණ වැඩමුළු හා සමූහ අධ්‍යයන කටයුතු සඳහා පූර්ණ අනුග්‍රහය දැක්වීම හා ඒවා පවත්වාගෙන යාම ;

(ඤ) ආරෝග්‍යශාලා ඇතුළු වෙනත් ගිලන්හල්වල රෝගීව සිටින පිරිස්වලට කායික, මානසික සහනය උදාකරමින් ඒ ඒ ආයතන වෙත ගොස් ඔවුන් වෙනුවෙන් ඉටු කළ යුතු කවර හෝ සේවාවක් අවශ්‍ය වේ නම් ඒ සඳහා අප්‍රමාදව ඉදිරිපත් වීම ;

(ක) ස්වාභාවික ආපදා ඇතුළු විවිධ ආපදාවන්ගෙන් පීඩාවට පත්වන ශ්‍රී ලාංකික ජනතාවට ඔවුන්ගේ කායික හා මානසික අභිවෘද්ධිය සඳහා ක්ෂණික මැදිහත්වීම හා ඔවුන් යථා තත්ත්වයට පත් කිරීමට ගතයුතු කවර කාර්යයක දී වුවද නොපමාව සක්‍රීය දායකත්වය සැපයීම ;

(ග) මිනිසාගේ විභව ශක්තීන් හඳුනාගෙන එකී ශක්තීන් සමාජ හා පුද්ගල ප්‍රගමනයට යොදා ගැනීම පිළිබඳව අවධානය යොමු කරමින් වඩාත් ශක්තිමත්, අධිෂ්ඨානශීලී, ඉලක්ක සහගත ජන ජීවිතයකට අවශ්‍ය ආකල්ප හා නිපුණතා සංවර්ධනය කිරීමෙන් පුද්ගල ස්වකීයත්වය ප්‍රවර්ධනය කිරීම;

(ච) මියගිය සෙබළුන්ගේ පවුල්වල අභිවෘද්ධිය උදෙසා ශුභසාධන කටයුතු සංවිධානය කිරීම හා ඔවුන් සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම ; සහ

(ජ) සංස්ථාවේ සියලු පරමාර්ථ හෝ ඉන් කිසිවක් මුදුන්පත් කර ගැනීමට අවශ්‍ය ආනුෂංගික හිතකර වෙනත් යම් ක්‍රියා සහ දේ ඉටු කිරීම ;

**සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.**

**4.** (1) සංස්ථාවේ කටයුතු, සභාපති වන වයඹ පළාත් සභා මන්ත්‍රී ඉන්ද්‍රාණි දසනායක මහත්මිය, ලේකම්, භාණ්ඩාගාරික, උපලේකම්වරු දෙදෙනකුගෙන් සහ කාරක සභිකයන් හයදෙනකුගෙන් සමන්විත පාලක සභාවක් විසින් සංස්ථාවේ රීතිවලට අනුව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම පාලක සභාව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ පාලක සභාවේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(3) පදනමේ වර්තමාන සභාපති ධුරය හොබවන්නා වූ ඉන්ද්‍රාණි දසනායක මහත්මිය ස්වකීය ධුරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් මිස ඇය විසින් යාවජීව වශයෙන් සංස්ථාවේ සභාපති ධුරය දරනු ලබන්නේ ය.

**සංස්ථාවේ සාමාන්‍ය බලතල.**

**5.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව :—

(අ) සංස්ථාවේ කාර්යයන් සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලයට ගැනීමට, අත්කර ගැනීමට, කුලියට ගැනීමට, ඉදි කිරීමට හෝ අන්‍යාකාරයෙන් ලබා ගැනීමට ;

(ආ) සංස්ථාවේ කාර්යයන් සඳහා රජයේ හෝ අනුමත බැංකු හා ආයතනවලින් මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට හෝ ආධාර සහ පරිත්‍යාග (දේශීය හෝ විදේශීය) වශයෙන් පාලක සභාවේ අනුමැතිය පරිදි ලබා ගැනීමට ;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් දීමට, ගනුදෙනු කිරීමට, මිලයට ගැනීමට, විකිණීමට, නිකුත් කිරීමට, සහ බැංකු ගිණුම් විවෘත කිරීමට ක්‍රියාත්මක කිරීමට සහ වැසීමට;

(ඈ) සංස්ථාවේ කාර්යයන් සඳහා වහා ම අවශ්‍ය නොවන යම් අරමුදලක් පාලක සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට;

(ඉ) දායක මුදල්, සම්මාදම්, ප්‍රදානයන්, පරිත්‍යාග සහ සියලු වර්ගවල ත්‍යාග ඉල්ලා සිටීමට සහ භාර ගැනීමට ;

(ඊ) යම් තැනැත්තකු, යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීමට ;

(උ) යම් ස්ථාවර දේපළකට හෝ පෞද්ගලික දේපළකට බලපාන නීත්‍යානුකූල භාර සහ කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට ;

(ඌ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයහි නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට, හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීමට ;

(එ) සංස්ථාවේ කාර්යයන් සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි සේවක පිරිස් පුහුණු කිරීමට ; සහ

(ඒ) සංස්ථාවේ පරමාර්ථ නිසි ලෙස හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ අවස්ථානුකූල වෙනත් සියලු දේ කිරීමට;

සංස්ථාවට බලය ඇත්තේ ය.

**6.** (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පරිදි පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් වර්ග කිරීම, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් නෙරපීම හෝ ඉල්ලා අස්වීම ;

(ආ) පාලක සභාව තෝරා පත් කර ගැනීම, නිලධරයන් ධුර අත් හැරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ පාලක සභාවේ බලතල, කාර්ය සහ චර්යාව;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය, කර්තව්‍ය සහ හැසිරීම ;

(ඇ) පාලක සභාවේ, සංස්ථාවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, එම රැස්වීම්වල දී පූරප්පාඩු පිරවීම දැන්වීම සහ න්‍යාය පත්‍ර, රැස්වීම පිළිබඳ ගණපූරණය සහ එහි දී කටයුතු කරගෙන යාම ;

(ඉ) පාලක සභාවේ සහ සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම් ; සහ

(ඊ) සංස්ථාවේ දේපළ පාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කරගැනීම.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනමේ රීති මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක්දුරට සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම රීති මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනි රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම, කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**7.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, එහි මුදල් වර්ෂය සෑම වර්ෂයක ම ජනවාරි මස 1 වන දින සිට දෙසැම්බර් මස 31 වන දින දක්වා විය යුතු ය.

(2) සංස්ථාව වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ පැවරීම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන සංස්ථාවේ පාලක සභාව විසින් අනුමත කරනු ලබන බැංකුවක සංස්ථාවේ නමින් තැන්පත් කළ යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

**8.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවැති පදනමේ සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය හා පදනම වෙත ගෙවිය යුතු සියලු සම්මාදම් මුදල් හා දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**9.** (1) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ “සුදුසුකම්ලත් විගණකවරයා” යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නාවූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක, එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනවලින් යම් ආයතනයක සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

**10.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසුව කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, ඒවා සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**11.** සංස්ථාවේ ලේකම්, සභාපති සහ භාණ්ඩාගාරිකවරයා ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමා පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් එකී සාධන පත්‍රයේ තම නම අත්සන් කළ යුතු ය. තව ද ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

**12.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.